

# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

**SOUTHERN PROVINCIAL COUNCIL**

## අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, பெருந்தெருக்கள் மற்றும் தகவல் அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය" , ලබුදූව, ගාල්ල.** கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor, "Dakshina Paya" , Labuduwa, Galle.

| මගේ අංකය. / எனது இல. / My No. | SP/EDUMIN/AD/03/02/LD | ඔබේ අංකය. / உனது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2026.06. 01 |
|---|---|---|---|---|---|

දකුණු පළාත් ඉඩම් කොමසාරිස්,

**<u>දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු -2026</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.05.18 දින අනුමැතිය ලබා දී ඇති අංක 02/2026 දරණ අභ්‍යන්තර චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

02. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන ජනපද නිලධාරී සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වල සේවයේ නියුතු මැනුම් ක්ෂෙත්‍ර සහායකයින්ගේ වාර්ෂික ස්ථානමාරු පිළිබඳ විධිවිධාන එකී චක්‍රලේඛය මඟින් දක්වා ඇති අතර මෙම වාර්ෂික ස්ථානමාරු 2026.08.01 දින සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

03. එබැවින් මෙම ස්ථානමාරු චක්‍රලේඛය පිළිබඳව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන ජනපද නිලධාරී සහ සහකාර ඉඩම් කොමසාරිස් කර්යාල වල සේවයේ නියුතු මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් දැනුවත් කර අදාළ ස්ථානමාරු අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම්ගේ හා ඔබගේ නිර්දේශ ද සහිතව 2026.06.15 දිනට ප්‍රථම මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

04. එසේම අදාල චක්‍රලේඛයේ 3.9 හි උපදෙස් දී ඇති පරිදි වසර 05 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති නමුත් , ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කර නොමැති නිලධාරීන්ගේ විස්තර මේ සමඟ අමුණා ඇති ඇමුණුම 02 ප්‍රකාරව මා වෙත ඉදිරිපත් කළ යුතු අතර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු කර ඇති නිලධාරීන්ගේ විස්තර ඇමුණුම් 03 ප්‍රකාරව මා වෙත යොමු කළ යුතු බව සඳහන් කරමි.තවද අංක 02 සහ අංක 03 ඇමිණුම්වල මෘදු පිටපත් <u>speducadre@gmail.com</u> වෙත 2026.06.16 දිනට යොමු කල යුතුය.

05. ස්ථාන මාරු ක්‍රියාවලියට අදාල කාල රාමුව පහතින් දක්වා ඇති අතර එකී කාල රාමුවට අනුකූල වන ලෙස සියලු ස්ථානමාරු කටයුතු සිදු කළ යුතු බැවින් මේ පිළිබඳ ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර අදාල සියලු තොරතුරු හා අයදුම්පත්‍ර නියමිත දිනට මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

| දිනය | කාරණය |
|---|---|
| 2026.06.01 | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| 2026.06.15 | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
| 2026.06.17 සිට2026. 06.25 | ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම |
| 2026.06.28 | වාර්ෂික ස්ථාන මාරු තීරණ දැනුම් දීම. |
| 2026.07.12 | වාර්ෂික ස්ථාන මාරු අභියාචනා භාර ගන්නා අවසන් දිනය |
| 2026.07.20 | වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන අවසන් කිරීම |
| 2026.07.22 | අභියාචනා තීරණ දැනුම් දීම |
| 2026.08.01 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |
| 2026.08.15 | ස්ථාන මාරු පිළිබඳ පසුවිපරම් වාර්තාව දිස්ත්‍රික්ක මට්ටමින් ලබා ගැනීම |

එන්.කේ.ආර්.පතිරණ,
ලේකම්.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

**ලේකම්** / செயலாளர் / Secretary: 091-2246156, 091-2030701
**කාර්යාලය** / காரியாலயம் / Office: 091-2030700 **පාලන** / நிர்வாகம் / Administration; 091-2030705 **අධ්‍යාපන** / கல்வி / Education
091-2030703 **සැලසුම්** / திட்டமிடல் / Planning; 091-2030702 **ගිණුම්** / கணக்காய்வ / Accounts
**ෆැක්ස්** / பெக்ஸ் / Fax: 091-2246157, 091-2234044
**ඊමේල්** / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk **ක්ෂණික ඇමතුම්** / அதிரடி அழைப்பு / Hot Line : 091-2030700 **වෙබ් අඩවිය** / இணையத்தளம் / web site : www.edumin.sp.gov.lk

අභ්‍යන්තර චක්‍රලේඛ අංක 02/2026

මාගේ අංකය:SP/EDUMIN/AD/03/02/LD
දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා... අමාත්‍යාංශය
දක්ෂිණපාය,
ලබුදූව.
2026.06.01

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් ,

<u>දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටිය</u>

දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන,මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයට අනුයුක්තව සේවයේ නියුතු ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළවයි.

1. දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන,මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් තනතුරුවල වාර්ෂික ස්ථාන මාරු 2026 අගෝස්තු 01 , දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති අතර, එහිදී සේවකයින්ට මෙන්ම රාජ්‍ය සේවයටද ඇති වන අපහසුතා මඟ හැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලැබේ.

2. දකුණු පළාත් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් පත්වීම් බලධරයා වන පහත සඳහන් තනතුරුවල සේවයේ නියුක්ත නිලධාරීන් මෙම ස්ථාන මාරු පටිපාටියට යටත් වේ.
   2.1. මැනුම් ක්ෂේත්‍ර සහායක
   2.2. ජනපද නිලධාරී

3. ස්ථාන මාරු සඳහා නිලධාරීන්ගේ සුදුසුකම් ආදිය ගැන තීරණ ගැනීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගත යුතුය.

3.1. සෑම වර්ෂයකම ජූනි මස 30 වන දිනට :-

(අ) කිසියම් සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව එම නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ආ) අදාළ සේවා කාලය සැලකීමේ දී නිලධාරියාගේ ඉල්ලීම මත ලබා ගෙන ඇති අනුයුක්ත සේවා කාලයත්, වැටුප් රහිතව විදේශ ගතව සිටි කාලයත් සලකා නොබැලිය යුතුය.

(ඇ) වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉදිරිපත් වන සියලුම අයදුම්පත් සලකා බැලීම හා වාර්ෂික ස්ථාන මාරු සඳහා සේවා කාලය සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන්ගේ තොරතුරු ස්ථාන මාරු මණ්ඩලය මඟින් සලකා බැලීම සිදු කරන නමුත් ,එම සියලු නිලධාරීන් සඳහා ස්ථාන මාරු නියෝග ලබා දෙන බව ඉන් අදහස් නොවේ.

3.2. 3.1 (අ) ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරු වීමට ඉල්ලා ඇති විටෙක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 3.1(ආ)ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති හා අයදුම්කොට ඇති ඒකකයේ වැඩිම සේවා කාලයක් සහිත සේවකයා ඉන් පිටතට මාරු කරනු ඇත.

3.3. (අ) සුවිශේෂී හේතු ඇති විට කිසියම් සේවා ස්ථානයක වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ද ස්ථාන මාරු අයදුම් කිරීමට හැකියාව ඇත.

3.4. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබා දීමට මාරු මණ්ඩල සෑම උත්සහායක්ම දරනු ඇත.

3.5. වයස අවු.58ක් ඉක්මවූ නිලධාරින් අදාළ නිලධාරීන්ගේ ඉල්ලීම මත මිස ස්ථාන මාරු කරනු නොලැබේ. අවු.55 ක් ඉක්ම වූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම්වලට යටත් වන්නේ ය. එහෙත් නිලධාරියාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු කිරීමට සලකා බලනු ඇත.

3.6. යම් සේවා ස්ථානයක ස්ථාන මාරු වීම් ලැබීමට සුදුසුකම් ලබන බහුතරයක් සිටී නම්, එම සේවා ස්ථානයේ කාර්යයන්ට හානියක් නොවන පරිදි ස්ථාන මාරු වීම් සිදු කිරීම සඳහා ස්ථාන මාරු කමිටු හැකි සෑම ආකාරයකින්ම ක්‍රියා කරනු ඇත.

3.7. අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටු සහ සමාලෝචන කමිටු සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති හා ආසන්නතම පූර්ව වර්ෂ දෙකක් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද, පිළිගත් වෘත්තීය සමිති නියෝජිතයන් සඳහා කැඳවීම සිදු කරනු ලැබේ. පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉහත 02 යටතට ගැනෙන සේවාවන්ට අයත් දකුණු පළාතේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති පමණක් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයට සහභාගී කරවා ගනු ඇත.

3.8. දකුණු පළාත් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් පිළිගත් ප්‍රස්තුත සේවයේ වෘත්තීය සමිතියක, මව් සංගමයේ ප්‍රධාන නිලතල උසුලන නිලධරයන් ස්ථාන මාරු කිරීම/නොකිරීම සම්බන්ධ අනුග්‍රහය ලබා ගැනීමට අපේක්ෂා කරන සියලුම වෘත්තීය සමිති එම අනුග්‍රහය ලබා දිය යුතු තම වෘත්තිය සමිති නිලධාරීන් පිළිබඳ විස්තර ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:5 වගන්තියේ ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරුවීම් මණ්ඩල කටයුතු ආරම්භ කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

3.9. ඉහත 3.1 (අ) හි සඳහන් පරිදි කිසියම් සේවා ස්ථානයක වසර 5ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් ඇමුණුම අංක 01 හි ඇතුළත් අයදුම්පත සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ හා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය හා නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කළ යුතුය. උක්ත අයදුම් පත්‍රයෙහි 20 යටතේ සඳහන් කළයුතු අපේක්ෂිත සේවා ස්ථාන, ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන සේවකයින්ගේ මනාපයට අනුව වන බවට ඔහු/ඇය විසින්ම 26 වන තීරුවෙහි තම අත්සන යොදා තිබිය යුතුය. ඉහත උපදෙස් දී ඇති පරිදි, <u>අදාළ සියලුම නිලධාරීන්ගේ තොරතුරු මා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.</u>

3.10.සෑම සේවකයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් /සහකාර ඉඩම් කොමසාරිස් වග බලා ගත යුතුය.සාවද්‍ය,අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන්/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් හා එම ලැයිස්තු සකස් කළ හා පරික්ෂා කළ නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල ක්‍රියාමාර්ගවලට ද යටත් වේ.

3.11. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය සඳහා සහභාගී වන සියලුම නිලධාරින් හා වෘත්තීය සමිති නියෝජිතයන් විසින් රහස්‍යභාවය සුරකින බවට ලිඛිත ප්‍රකාශයක් ලබා දිය යුතු අතර, රහස්‍ය භාවය සුරැකීමට කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත හැකිය.

3.12. වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ ලබා ගැනීමේ දී, ස්ථාන මාරු විෂය නිලධාරීන්ගේ ගොනුගත කරුණු විමසා බැලීමේ හැකියාව අදාළ ස්ථානමාරු කමිටුවේ සභාපති හට පවතී.

3.13. පහත තනතුරුවලින් සැදුම්ලත් වාර්ෂික ස්ථානමාරු කමිටුවක් පත්කිරීමට දකුණු පළාත් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් කටයුතු කරනු ඇත.

- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්.(පාලන) (සභාපති)
- නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්(පාලන),(දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව)
- සහකාර ඉඩම් කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට)
- සුදුසුකම් ලත් වෘත්තීය සමිති නියෝජිතයන් එක් අයෙකු බැගින්

4. අභියාචනා මණ්ඩලය

4.1 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා අභියාචනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්.
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව සේවකයින්ට සිදු වූ හදිසි විපත් කරදර,අසනීප වැනි සානුකම්පිත තත්වයන් සම්බන්ධයෙන් පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව.
- වාර්ෂික ස්ථාන මාරු සඳහා නම් කළ නිලධාරියෙකු තව දුරටත් තම ආයතනයේ රඳවා ගැනීමට ස්ථානමාරුලාභියාගේ එකඟතාවය සහිතව සිදුකරන හේතු සහගත නිර්දේශ.

4.2. ස්ථාන මාරු අභියාචනා සලකා බැලීම සඳහා පහත නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් සිදුකරනු ලබයි.

- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සභාපති)
- දකුණු පළාත් ඉඩම් කොමසාරිස්,(දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව)
- නියොජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස් (පාලන) (ද.ප. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව)
- සුදුසුකම් ලත් වෘත්තීය සමිති නියෝජිතයන් එක් අයෙකු බැගින් නිරීක්ෂණ මට්ටමින් සහභාගි විය හැකිය.

5. සෑම වර්ෂයකම වාර්ෂික ස්ථාන මාරු නිවේදනය නිකුත් කල දින සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන තෙක් ජනපද නිලධාරී/මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයට අදාළ සුහද ස්ථාන මාරු විම් ඇතුළු අනෙකුත් ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතුය.

6. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධාරීන් ,නියමිත දිනයේ නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී ඇත.

7. මාරු මණ්ඩල මඟින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති සේවකයින් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ මුදා හැරීමට සෑම ආයතන ප්‍රධානියෙකුම කටයුතු කළ යුතුය.

8. යම් හෙයකින් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන දිනය දීර්ඝ වන්නේ නම්, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ දින සිට ඒ වන විටත් ගෙන ඇති වාර්ෂික ස්ථාන මාරු තීරණයන්ට අගතියක් නොවන පරිදි සුහද ස්ථාන මාරු වීම් හා සේවා අවශ්‍යතාවය අනුව ස්ථාන මාරු වීම් ලබා දීමට බාධාවක් නොමැත.

9. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින නිලධාරියෙකුට නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකි වන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් ලෙස මුදාහැරීමට කටයුතු නොකරන බලධරයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම අදාළ විනය බලධරයින්ගේ වගකීම වන්නේය.

10. මෙම ස්ථානමාරු සම්බන්ධව සෑහීමකට පත් නොවන අවස්ථාවකදී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දින 14ක් තුළ අභියාචනා කිරීමට ස්ථාන මාරු ලාභින්ට මෙන්ම ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන්ටද හැකියාව පවතී.

11. මෙම චක්‍රලේඛය අදාළ සියලු නිලධාරින් දුටු බවට තහවුරු කර ගැනීමට කටයුතු කරන මෙන් දන්වමි.

12. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා ඇති නිලධරයෙකු තම ආයතනයෙන් මුදාහැරීම සඳහා ඔහුගේ අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් නොසිට ඔහුගේ රාජකාරී කටයුතු ආවරණය කිරීමට තාවකාලික වැඩ පිළිවෙළක් අභ්‍යන්තර වශයෙන් යොදා ගැනීමට ආයතන ප්‍රධානියා ක්‍රියා කළ යුතු වන්නේ ය.

එන්.කේ.ආර්.පතිරණ,
ලේකම්.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| දිනය | කාරණය |
|---|---|
| 2026.06.01 | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම. |
| 2026.06.15 | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
| 2026.06.17 සිට2026.06.25 | ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම |
| 2026. 06.28 | ස්ථාන මාරු තීරණ දැනුම් දීම |
| 2026. 07.12 | ස්ථාන මාරු අභියාචනා භාර ගන්නා අවසන් දිනය |
| 2026.07.20 | ස්ථාන මාරු අභියාචනා සමාලෝචනය අවසන් කිරීම |
| 2026. 07.22 | අභියාචනා තීරණ දැනුම් දීම |
| 2026. 08.01 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම |
| 2026. 08.15 | ස්ථාන මාරු පිළිබඳ පසුවිපරම් වාර්තාව දිස්ත්‍රික්ක මට්ටමින් ලබා ගැනීම |

# වාරෂික සථාන මාරු අයදුමපත්‍රය

(වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අවු:05 හෝ ඊට වැඩි සියළුම සේවකයින් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.)

| | |
|---|---|
| සේවය: | පන්තිය හා ශ්‍රේණිය: |

| | | | |
|---|---|---|---|
| **අ.) පෞද්ගලික තොරතුරු** | | | |
| 01. සම්පූර්ණ නම | | | |
| 02. මුලකුරු සමඟ නම | | | |
| 03. උපන් දිනය | | 04. ජා.හැ.ප.අංකය | |
| 05. ස්ථාන මාරු කැඳවන දිනට වයස | | 06. ස්ත්‍රී/පුරුෂ භාවය | |
| 07. ස්ථිර/තාවකාලික ලිපිනයන් | | 08. දුරකථන අංකය | කාර්යාලය:<br>පෞද්ගලික: |

| | | |
|---|---|---|
| 09. විවාහක/අවිවාහක බව | 10. කලත්‍රයාගේ නම | 11. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය<br>12. පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර:-කි.මී. |
| 13. දරුවන් ගණන (අබාධිත නොවන) | 14. ඔවුන්ගේ වයස | 15. ඉගෙනුම ලබන්නේ නම් පාසල් |
| | | |
| | | |
| | | |
| | | |
| 16.දරුවන් ගණන (අබාධිත) | ඔවුන්ගේ වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල් |
| | | |
| | | |

| | |
|---|---|
| **ආ.) සේවා තොරතුරු** | |
| 17වර්තමාන සේවා ස්ථානය : | 18.සේවා ස්ථානය පිහිටි නගරය: |
| 19.වර්තමාන සේවා ස්ථානයට වාර්තා කල දිනය :<br>20. පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර:-කි.මී. | 21.වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :<br>අවු..........මාස..........දින........... |

| 22.රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | සේවා ස්ථානය | සේවා කාලය | | |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | කාලය |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| 23.ආසන්න වසරක කාලයකදී වෙනත් සේවා ස්ථානයකට හෝ ස්ථාන කිහිපයකට අනුයුක්තව සේවය කර ඇත්නම් එම සේවා ස්ථාන | අනුයුක්ත සේවා ස්ථානය | අනුයුක්ත කාලය | | |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | කාලය |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**ඈ.) ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (තම කැමැත්තේ අනුපිළිවෙළට සේවා ස්ථාන 03ක් නම් කරන්න)**

| 24. | සේවා ස්ථානය | පිහිටි නගරය | පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර:-කි.මී. |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

25.ස්ථාන මාරු ඉල්ලුම් නොකිරීමට විශේෂ හේතු: (සේවකයා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයකින් පෙළෙන්නේ නම් ඒ බවට වෛද්‍ය සහතිකවලින් කහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන කාලය තුළ ප්‍රසූත නිවාඩු යාමට නියමිතව ඇති නම් ඒ බව සඳහන් කරන්න)

26.ඉහත දක්වා ඇති සියල්ල තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හැකි බව දන්නා බවටත් සහතික වෙමි.

................................ ....................................

දිනය අත්සන

ඇ.) ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

27.ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-

i. ස්ථාන මාරු මණ්ඩලය වෙත දැනුම් දිය යුතු විශේෂ කරුණු (තිබේ නම් පමණක්)

.....................................................................................................................

ii. සේවකයාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/රහිතව) නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

iii. නිර්දේශ නොකරන්නේ නම් හේතු :

..................................                                   ..................................

දිනය                                   ආයතන ප්‍රධානියාගේ (ප්‍රාදේශීය ලේකම්) අත්සන හා නිල මුද්‍රාව

28.දකුණු පළාත් අධ්‍යාපන ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.

i. සේවකයා විසින් අනු අංක 01 සිට 23 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ /ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදි බවට සහතික කරමි.

ii. සේවකයාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/රහිතව) නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි.

..................................                                   ..................................................

දිනය                                   දකුණු පළාත් ඉඩම් කොමසාරිස් ( අත්සන හා නිල මුද්‍රාව)

29.ඉහත අංක 01 සිට 23 දක්වා තොරතුරු සියල්ල නිවැරදි බව සහතික කරන අතර,මෙම නිලධාරියාගේ /නිලධාරිනියගේ ස්ථාන මාරුව .........................................................වෙත අනුමත කරමි/නොකරමි.

...........................                                   ........................................

දිනය                                   අමාත්‍යාංශ ලේකම්ගේ (අත්සන හා නිලමුද්‍රාව)

ඇමුණුම 02

## දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරීන්ගේ තොරතුරු ලේඛනය

තනතුර-

| | අනු අංකය | නිලධාරියාගේ නම | මුල් පත්වීම් දිනය | ජා.හැ.අං. | 2026.06.30 දිනට වයස | ස්ථිර පදිංචි ලිපිනය | තාවකාලික පදිංචි ලිපිනය | වර්තමාන නිත්‍ය සේවා ස්ථානය හා පදිංචි ලිපිනයේ සිට දුර | වර්තමාන නිත්‍ය සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.06.30 දිනට) - අනුයුක්ත කාල සීමා ඇත්නම් එම කාල සීමා හැර | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ රැකියාව(රජයේ/ පෞද්ගලික/විදේශ/රැකියා නැති) | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත නොවන) | | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත ) | | නිලධාරියා හෝ යැපෙන්නන් යම් රෝගාබාධයකින් පෙළෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර | ආසන්නතම කාල සීමාව තුළ පූර්ව සේවා ස්ථාන 02 | | | | නිලධාරියා ඉල්ලුම් කර ඇති ප්‍රදේශිය ලේ.කාර්. සිට පදිංචි ස්ථානයට ඇති දුර | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | | 1 | | 2 | | පාසල 01 හා දුර | පාසල 02 හා දුර | පාසල 03 හා දුර |
| | | | | | | | | | | | | | | | | | සේවා ස්ථානය | කාල සීමාව | සේවා ස්ථානය | කාල සීමාව | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

ඇමිණුම 03

## දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු ජනපද නිලධාරී සහ මැනුම් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරු ලේඛනය

තනතුර-

| | අනු අංකය | නිලධාරියාගේ නම | මුල් පත්වීම් දිනය | ජා.හැ.අං. | 2026.06.30 දිනට වයස | ස්ථිර පදිංචි ලිපිනය | තාවකාලික පදිංචි ලිපිනය | වර්තමාන නිත්‍ය සේවා ස්ථානය හා පදිංචි ලිපිනයේ සිට දුර | වර්තමාන නිත්‍ය සේවා ස්ථානයේ සේවා කාලය ( 2026.06.30 දිනට) - අනුයුක්ත කාල සීමා ඇත්නම් එම කාල සීමා හැර | විවාහක/ අවිවාහක බව | කලත්‍රයාගේ රැකියාව(රජයේ/ පෞද්ගලික/විදේශ/රැකියා නැති) | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත නොවන) | | දරුවන් පිළිබඳ වස්තර(ආබාධිත ) | | නිලධාරියා හෝ යැපෙන්නන් යම් රෝගාබාධයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර | ආසන්නතම කාල සීමාව තුළ පූර්ව සේවා ස්ථාන 02 | | | | නිලධාරියා ඉල්ලුම් කර ඇති ප්‍රදේශිය ලේ.කාර්. සිට පදිංචි ස්ථානයට ඇති දුර | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසල | | 1 | | 2 | | පාසල 01 හා දුර | පාසල 02 හා දුර | පාසල 03 හා දුර |
| | | | | | | | | | | | | | | | | | සේවා ස්ථානය | කාල සීමාව | සේවා ස්ථානය | කාල සීමාව | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |